විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

මාධ්‍ය නිවේදනය

සෞදි අරාබි රාජධානියේදී අනෝජන් සිවරාසා මහතාට එරෙහි නඩු කටයුතු නිල වශයෙන් අවසන් කිරීමට ගත් තීරණය ශ්‍රී ලංකා රජයේ පැසසුමට

ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන අනෝජන් සිවරාසා මහතා සම්බන්ධයෙන් පවතින නඩුවේ ඉදිරි නීතිමය කටයුතු තවදුරටත් පවත්වාගෙන නොයාමට සහ එම නඩුව නිල වශයෙන් අවසන් කිරීමට සෞදි අරාබි රාජධානියේ රජයේ අභිචෝදක අධිකාරිය විසින් ගනු ලැබූ තීරණය පිළිබඳව ශ්‍රී ලංකා රජය සිය ප්‍රසාදය පළ කරයි.

මෙම සාධනීය ප්‍රගතිය අත්කර ගැනීමට හැකි වූයේ, සිවරාසා මහතාට මීට පෙර පනවා තිබූ මරණ දඬුවම අවලංගු කර, වැඩිදුර නඩු කටයුතු සඳහා එම නඩුව අල්-අහ්සා අපරාධ අධිකරණය වෙත යළි යොමු කිරීමට සෞදි අරාබි රාජධානියේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2026 ඔක්තෝබර් 13 වැනි දින ලබා දුන් තීන්දුවෙන් අනතුරුවය. 2026 ඔක්තෝබර් 27 වැනි දින පැවති නඩු විභාගයේදී, අදාළ නීතිමය ක්‍රියාපටිපාටිවලට අනුකූලව වැඩිදුර විමර්ශන සිදු කිරීම සඳහා අධිකරණය විසින් එම නඩුව රජයේ අභිචෝදක අධිකාරිය වෙත යොමු කරන ලදී. ඉන් අනතුරුව සිදු කරන ලද විමර්ශන ක්‍රියාවලිය අවසන් වීමෙන් පසු, නඩුවට අදාළ ඉදිරි නීතිමය කටයුතු තවදුරටත් පවත්වාගෙන නොයාමට සහ එම නඩුව නිල වශයෙන් අවසන් කිරීමට රජයේ අභිචෝදක අධිකාරිය තීරණය කර ඇත.

ඒ අනුව, සිවරාසා මහතාට මීට පෙර පනවා තිබූ සියලු දඬුවම් අවලංගු කර ඇති අතර, ඒවා තවදුරටත් බලාත්මක නොවේ.

අද දින (2026 නොවැම්බර් 11), විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය ගරු විජිත හේරත් මහතා අමාත්‍යාංශයේදී සිවරාසා මහතාගේ පවුලේ සාමාජිකයන් හමු වී, නඩුව නිල වශයෙන් අවසන් කිරීම සහ සිවරාසා මහතා ශ්‍රී ලංකාවට නැවත පැමිණීම සඳහා පහසුකම් සැලසීමට මේ වන විට සිදු කෙරෙමින් පවතින කටයුතු ඇතුළු නවතම ප්‍රගතිය පිළිබඳව ඔවුන් දැනුවත් කළේය.

මෙම ක්‍රියාවලිය පුරා ලබා දුන් සහයෝගීතාව සහ ඵලදායී මැදිහත්වීම මෙන්ම, සෞදි අරාබි රාජධානියේ ස්ථාපිත නීතිමය හා ආයතනික ක්‍රියාපටිපාටි ඔස්සේ අත්කර ගන්නා ලද සාධනීය ප්‍රතිඵලය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය සෞදි අරාබි රාජධානියේ රජයට සහ අදාළ සෞදි බලධාරීන්ට සිය අවංක කෘතඥතාව පළ කරයි.

සෞදි අරාබි නීති විශේෂඥයන් සමඟ සම්බන්ධීකරණයෙන් නීතිමය සහාය ලබා දීම සඳහා රියාද් නුවරට ගොස් කටයුතු කළ ශ්‍රී ලාංකික නීති විශේෂඥයන්ගේ සාමූහික ප්‍රයත්නය මෙන්ම, මෙම අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරමින් රියාද්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් අඛණ්ඩව සිදු කරන ලද රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීම ද ශ්‍රී ලංකා රජය ඇගයීමට ලක් කරයි. මෙම සියලු ප්‍රයත්න සෞදි අරාබි රාජධානියේ ස්වෛරීභාවය, නීතිමය රාමුව සහ අධිකරණ ක්‍රියාපටිපාටි කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින් සහ පූර්ණ ගෞරවය පළ කරමින්, අදාළ සෞදි බලධාරීන් සමඟ සමීප සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාත්මක කරන ලදී.

Foreign Affairs
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்
Republic Building, Colombo 1
ජනරජ මන්දිරය, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
☎ 2 325 373/5, 2 207 200/7
cypher@mfa.gov.lk

Foreign Employment
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு
17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5
17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5
17 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்ட, கொழும்பு 5
☎ 2 331 200
info@mfe.gov.lk

Tourism
සංචාරක
சுற்றுலாத்துறை
No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03,டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு(சர் ராசிக் ஃபரீத் மாவத்தை),கொழும்பு 1
☎ 2 381 798, 2 321 222
secretary@tourismmin.gov.lk

සිවරාසා මහතා කඩිනමින් ශ්‍රී ලංකාවට නැවත පැමිණීම සඳහා අවශ්‍ය නීතිමය හා පරිපාලනමය කටයුතු සම්පූර්ණ කිරීම තහවුරු කර ගැනීම සඳහා, අමාත්‍යාංශය රියාද්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා අදාළ සෞදි බලධාරීන් සමඟ අඛණ්ඩව සමීප සම්බන්ධීකරණයෙන් කටයුතු කරමින් සිටී.

විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ සුබසාධනය, අභිමානය සහ යහපත සුරක්ෂිත කිරීමට ශ්‍රී ලංකා රජය දැඩි ලෙස කැපවී සිටින අතර, විදේශයන්හි පිහිටි සිය රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල හරහා ශ්‍රී ලාංකික පුරවැසියන්ට ලබා දිය හැකි සියලු රාජ්‍යතාන්ත්‍රික, නීතිමය සහ කොන්සියුලර් සහාය අඛණ්ඩව ලබා දීමට කටයුතු කරනු ඇත.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
කොළඹ 01

2026 නොවැම්බර් **11** වැනි දින

Foreign Affairs
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்
Republic Building, Colombo 1
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
☎ 2 325 373/5, 2 207 200/7
cypher@mfa.gov.lk

Foreign Employment
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு
17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5
17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5
17 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்ட, கொழும்பு 5
☎ 2 331 200
info@mfe.gov.lk

Tourism
සංචාරක
சுற்றுலாத்துறை
No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03,டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு(சர் ராசிக் ஃபரீத் மாவத்தை),கொழும்பு 1
☎ 2 381 798, 2 321 222
secretary@tourismmin.gov.lk